1114. නන්දි සංයොජනො ලොකො (උදයාති භගවා)
විතක්කස්ස විචාරණා,
තණ්හාය විප්පහානෙන නිබ්බානමිති වුච්චති.

1115. කථං සතස්ස චරතො (ඉච්චායස්මා උදයො)
විඤ්ඤාණං උපරුජ්ඣති,
භගවන්තං පුට්ඨුමාගම්ම තං සුණොම වචො තව:

1116. අජ්ඣත්තඤ්ච බහිද්ධා ච වෙදනං නාභිනන්දතො,
එවං සතස්ස චරතො විඤ්ඤාණං උපරුජ්ඣතීති.

උදයසුත්තං තෙරසමං[1].

## 5 – 14

### පොසාලසුත්තං[2]

1117. යො අතීතං ආදිසති (ඉච්චායස්මා පොසාලො)
අනෙජො ඡින්නසංසයො,
පාරගුං සබ්බධම්මානං අත්ථි පඤ්හෙන ආගමං,

1118. විභූතරූපසඤ්ඤිස්ස සබ්බකායප්පහායිනො
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චීති පස්සතො,
ඤාණං සක්කානු පුච්ඡාමි කථං නෙය්‍යො තථා විධො.

1119. විඤ්ඤාණට්ඨිතියො සබ්බා (පොසාලාති භගවා)
අභිජානං තථාගතො
තිට්ඨන්තමෙනං ජානාති විමුත්තං තප්පරායණං.

1120. ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා නන්දි සංයොජනං ඉති,
එවමෙතං අභිඤ්ඤාය තතො තත්ථ විපස්සති:
එතං ඤාණං තථං තස්ස බ්‍රාහ්මණස්ස වුසීමතොති.

පොසාලසුත්තං චුද්දසමං[3].

1. උදයමාණව පුච්ඡා තෙරසී-මජ්ඣං
2. පොසාලමාණව පුච්ඡා
3. පොසාලමාණව පුච්ඡා චුද්දසී.



Free Distribution www.aathaapi.org

1114 ලොකසත්ත්වයා තෘෂ්ණාව සංයෝජන කොට ඇතියේ ය. විතර්කය ඔහට විචාරණය වේ. එ තෘෂ්ණාවගේ විප්‍රහාණයෙන් නිර්වාණ යැ'යි කියනු ලැබේ,

1115 (ආයුෂ්මත් උදයමාණව මෙසේ ඇසීය:) ස්මෘති සම්පන්න ව වාසය කරන්නාහුගේ විඥනය කි සෙයින් නිරුද්ධ වේ ද? භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්නට පැමිණියම්හ. මුඹ වහන්සේගේ එ බස් අසම්හ.

1116 අධ්‍යාත්මාලම්බනයෙහි ද බාහිරාලම්බනයෙහි ද උපදනා වේදනාව නො පතන, ස්මෘතිමත් වැ හැසිරෙණුවහුගේ විඥනය මෙසේ නිරුද්ධවේ යයි.

**උදයමාණව පෘච්ඡා නිමි.**

## 5 – 14

## පොසාලමාණවක පෘච්ඡා

1117 (ආයුෂ්මත් පොසාල මාණවක මෙසේ විචාරයි:) එජා සංඛ්‍යාත තෘෂ්ණා රහිත වූ සිඳුනා ලද සැක ඇති, යම් සර්වඥ කෙනෙක් ස්වකීයවූ ද පරකීය වූ ද අතීතය (පූර්වනිවාසානුස්මෘති ඥණයා ) ප්‍රකාශ කෙරෙත් ද, සියලු ධර්මයන්ගේ පාරිමතිරප්‍රාප්ත වූ එ සර්වඥයන් කරා ප්‍රශ්නයෙන් අර්ථිව පැමිණියෙම් වෙමි.

1118 ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස, මොනොවට ඉක්මවන ලද රූපසංඥ ඇති, තදංග-වික්ඛම්භණ වශයෙන් හැම රූපකාය ප්‍රහාණය කරනසුලු අධ්‍යාත්මයෙහිත්, බාහිරයෙහිත් කිසිවක් නැතැ'යි දක්නාහු (ආකිඤ්චඤ්ඤායතනලාභීහු) ගේ ඥනය පුලුවුස්මි. එ බඳු වූ පුද්ගල තෙම කිසෙයින් මත්තෙහි ඥනයට පැමිණවිය යුත්තේ ද?

1119 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක: පොසාලයෙනි), තථාගතයෝ හැම විඥනස්ථිතීන් වෙසෙසින් දන්නාහු ආකිඤ්චඤ්ඤායතනයෙහි අධිමුක්ත වූ එය මැ පරායණ කොට ඇති මෙ පුහුලා දන්නාහ.

1120 ආකිඤ්චඤ්ඤායතනයෙහි උපදවන අරූපරාග සංඛ්‍යාත නන්දිය සංයොජනයෙකැ'යි මෙසේ විශිෂ්ට ඥනයෙන් දැන ඉක්බිති එහි අනිත්‍යාදි විසින් විදර්ශනා (භාවනා) කරන්නේය. වැස නිම වූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවාසය ඇති බාහිතපාපී වූ එ රහත්හුගේ කෙල අර්හත්ව ඥනය අවිපරීත වේ යයි.

**පොසාලමාණව පෘච්ඡා නිමි.**